# පටුන


| විස්තරය | පිටු අංකය |
|---|---|
| පටුන | 1 |
| හැඳින්වීම | 2-3 |
| පසුබිම | 3 |
| දැක්ම | 5 |
| මෙහෙවර | 5 |
| අරමුණු | 5 |
| පළාත් පාලන ආයතනය පිළිබඳ පොදු තොරතුරු | 6-8 |
| ඝණ අපද්‍රව්‍ය කළමණාකරණයට අදාළ දත්ත හා තොරතුරු | 8 |
| කසල ජනනය පිළිබඳ තොරතුරු | 8 |
| කසල එකතු කිරිමට ඇති මානව හා භෞතික සම්පත් ප්‍රමාණය | 9 |
| කසල එකතු කරන ක්‍රමවේදය | 9-11 |
| මොනරාගල ප්‍රාදේශීය සභාව කසල එකතු කරන සීමාව | 12 |
| ඝන අපද්‍රව්‍ය කළමණාරන මධ්‍යස්ථානය හා අවසන් බැහැරලන ස්ථානයට අදාළ තොරතුරු | 12-13 |
| කොම්පෝස්ට් ව්‍යාපෘතිය/කාර්ය මණ්ඩලය/ව්‍යාපෘතියේ ඇති සම්පත් | 14 |
| බහුලව කසල ජනනය වන ස්ථාන/කසල එක්රැස් කරන ප්‍රභවයන් හා ප්‍රමාණයන් | 15 |
| ඝණ අපද්‍රව්‍ය කළමණාකරණයට අදාළ සංවිධාන සටහන | 16 |
| සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩල තොරතුරු | 17 |
| ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කමිටුව | 18 |
| ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ඇති වෙනත් ක්‍රියාමාර්ග | 18-19 |
| පස් අවුරුදු සැලැස්මට අදාළව හඳුනාගත් අරමුණු හා ඉලක්ක | 20 |
| ක්‍රියාකාරි සැලැස්ම - 2021 වර්ෂය | 21-27 |
| සභා අරමුදල් හැර වෙනත් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරිමට යෝජිත ක්‍රියාකාරකම් | 28 |
| 2021 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක | 29-32 |
| ඝණ අපද්‍රව්‍ය කළමණාකරනයේ විකාශනය | 33 |
| අත් කරගත් ජයග්‍රහණ | 33-34 |

**හැඳින්වීම**

ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ මොනරාගල මැතිවරණ බල ප්‍රදේශය තුළ පිහිටි මොනරාගල ප්‍රාදේශීය සභාව වර්ග කිලෝමීටර් 255ක වපසරියකින් සමන්විත වේ. පළාත් පාලන ඡන්ද බල ප්‍රදේශ 10 න් සහ ග්‍රාම සේවා වසම් 26 සමන්විත මෙම බල ප්‍රදේශයේ සිංහල, දෙමළ, මුස්ලිම් සහ වෙනත් ජනවර්ග 58073 (2019 සංගනනය) ක් පමණ ජීවත් වේ. ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වන අතර, ස්වයං රැකියා ව්‍යාපාර හා රජයේ හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් මෙම බල ප්‍රදේශය තුළ ජීවත් වේ.

02. විහාරමුල්ල, මොනරාගල, සිරිගල, මුප්පනේ, හුලංදාව හා වැලියාය යන ග්‍රාම සේවා 06 තුල මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සීමාව විසිරී ඇති අතර නාගරික සීමාවේ පොතුවිල් පාර , වැල්ලවාය පාර ප්‍රධාන මාර්ගය දෙපස හා අතුරු මාර්ග කි.මී.08 ක් පමණ හා රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පොදු වෙළඳපල, සතිපොළ , හුලංදාව හරිත උද්‍යානය , මොණරාගල ළමා උද්‍යානය මෙන්ම කුඹුක්කන සහ නක්කල උප නගර ද ඇතුලුව දිනකට කසල ටොන් 12-14 අතර ප්‍රමාණයක් ප්‍රාදේශීය සභාව විසින් එක්රැස් කරනු ලබයි.

1987 අංක 28 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පැවරී ඇති බලතල අනුව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනනය වන කසල එකතු කිරීම ප්‍රවාහනය සහ එකතු කරන කසල සඳහා ප්‍රතිකර්ම යෙදීම යන කාරණා ප්‍රාදේශිය සභාව විසින් සිදු කරනු ලබයි. කසල කළමණාකරණ ක්‍රියාවලිය වෙනුවෙන් ස්ථිර හා අනියම් කම්කරුවන් 35 ක් දිවා හා රාත්‍රී ලෙස සේවා මුර දෙකක් යටතේ යොදවා ඇත. රාත්‍රී සේවා මුරය මොනරාගල නගරය මුල් කර ගනිමින් සිදු කරනු ලබන අතර, දිවා සේවා මුරය කලාප 04 ක් යටතේ සිදු කරනු ලබයි.

කසල එකතු කිරීම, ප්‍රවාහනය හා කළමණාකරණ ක්‍රියාවලිය, සෞඛ්‍ය සහාලේකම් හා කාර්මික නිළධාරින් විසින් අධික්ෂණය කරනු ලබන අතර, ඝණ අප අපද්‍රව්‍ය කළමණාකරන ක්‍රියාවලිය සැලසුම් කිරිම හා ඊට අදාල විෂය කටයුතු විෂය භාර නිළධාරි විසින් සිදු කරන අතර කම්කරු පාලනය හා අනෙකුත් දෛනික සේවක කළමනාකරණ කටයුතු හා දෛනික සේවාවන්ට අදාල පොත්පත් නඩත්තු කටයුතු සෞඛ්‍ය පරිපාලකවරයෙකු විසින් සිදු කරනු ලබයි.

ප්‍රාදේශිය සභාව විසින් එකතු කරන කසල, හොරොම්බුව සුදුවතුර ආර දරගොඩ ස්ථානයේ පිහිටි කසල අංගනය තෙක් ප්‍රවාහනය කිරිම සඳහා සභාව සතු ට්‍රැක්ටර් රථ 05ක් සහ ටිපර් රථයක් යොදා ගනු ලබයි. මෙම ට්‍රැක්ටර් රථවල ටේලර දිරන සහ නොදිරන ලෙස වෙන්කර, එකතු කරනු ලබන කසල වෙන වෙනම බැහැරලිය හැකි පරිදි කම්කරුවන් විසින් සකස් කර ගනු ලබන අතර ප්‍රාදේශිය සභාවේ කම්කරුවන් ජනතාව විසින් කසල බැහැර කර ඇති ස්ථානයේදිම දිරන හා නොදිරන ලෙස වෙන් කර , කසල අංගනය තෙක් ප්‍රවාහනය කරනු ලබයි.

මෙසේ එකතු කරනු ලබන කසල , මොනරාගල ප්‍රාදේශිය සභාව වෙත වන සංරක්ෂන දෙපාර්තමේන්තුව විසින් අංක එච්07/620/2013 දරන විවිධ අවසර පත්‍රය යටතේ හොරොම්බුව තේක්කවත්ත දරගොඩ ස්ථානයෙන් ලබාදී ඇති අක්කර 04 ½ ක ඉඩමේ සකස් කර ඇති කොම්පෝස්ට් ව්‍යාපෘතිය සහ අවසන් බැහැරලන ස්ථානය තෙක් ප්‍රවාහනය කරනු ලබයි. දිරන සහ නොදිරන ලෙස වෙන් කර ඇති කසල වලින් දිරන කසල යොදා ගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර නොදිරන කසල තව දුරටත් වීදුරු, කාඩ්බෝඩ්, ප්ලාස්ටික්,පෙට් බෝතල්, ඉටිකොල, ටින්, යකඩ , රබර් ලෙස වෙන් කර සභාවේ කම්කරුවන් විසින් කසල අංගනය තුල වෙන වෙනම ගබඩා කර කලින් කලට මොනරාගල නගරයේ පිහිටුවා

ඇති කසල සම්පත් මධ්‍යස්ථානයට යොමු කරනු ලබයි. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල අලෙවි කිරිමෙන් ලැබෙන ආදායම කම්කරුවන්ගේ දෛනික සුබ සාධන කටයුතු වෙනුවෙන් යොදා ගැනිමට අවසර ලබා දි ඇත.

කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රාදේශීය සභාව සතුව කොම්පෝස්ට් අංගනයක් අවසන් කසල බැහැරලීම සිදු කරන ඉඩම තුල ඉදිකර ඇත. එම කොම්පොස්ට් අංගනය 2011 වර්ෂයේ මොනරාගල දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමණාකරණ සහායක මධ්‍යස්ථානය විසින් මොනරාගල ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරණ කටයුතු විධිමත් කිරිම වෙනුවෙන් ලබා දෙන ලදී. කොම්පෝස්ට් අංගනය තුළ දිරන කසල යොදා ගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය කරන අතර, ඒ සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් යොදවා ඇත. නොදිරන කසල වලින් ප්‍රත්‍යචක්‍රිකරණයට යොමු කර ඉතිරිවන කසල හා කොම්පෝස්ට් පොහොර සකස් කර ඉතිරි වන ද්‍රව්‍ය මේ වන විට විවෘත හෝ සකස් කරන ලද වලවල් වලට බැහැර කරනු ලබයි.

**<u>පසුබිම</u>**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට වර්ෂයේ වැඩි කාලයක් වියළි කාලගුණික තත්වයක් පවතින අතර, ජනවාරි, පෙබරවාරි, හා නොවැම්බර් , දෙසැම්බර් කාලවලදි වර්ෂයේ අනෙක් කාල වලට සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක් පවතී. මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ නාගරික සීමාව සීඝ්‍රයෙන් පුලුල් වෙමින් පවතින අතර, නාගරික සීමාවේ ඇති ඉඩම් ඉතා සීඝ්‍රයෙන් කොටස්වලට කැඩෙමින් පර්චස් 10 – 15 අතර, කුඩා කැබලි බවට පත්වෙමින් ජනාකීර්න තත්වයට පත්වෙමින් තිබේ.

නාගරික බල ප්‍රදේශයේ ස්ථිර පදිංචියට පැමිනෙන ජනගහනය වාර්ෂිකව සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ යමින් පවතින අතර, නොයෙකුත් අවශ්‍යතා වෙනුවෙන් නගරයට සංක්‍රමණය වන ජනගහනයද ඒ හා සමානව ඉහළ යමින් තිබේ. තවද මොනරාගල යනු නැගෙනිර, මධ්‍යම හා දකුණු පළාත් වලට ගමන් පහසුකම් සපයාගත හැකි අතරමැදි ගමනාගමන හුවමාරු මධ්‍යස්ථානයක් වන හෙයින් දෛනිකව නගරයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් ප්‍රමාණය ද සැලකිය යුතු ප්‍රමානයකින් ඉහල යමින් පවති.

නාගරික සීමාවේ සිදුවන සීඝ්‍ර සංවර්ධනයත් ඉඩම් කට්ට වලට කැඩී යාමෙන් පදිංචිකරුවන් ප්‍රමාණය වැඩිවීමත් නගරයට සංක්‍රමණය වන ජනගහනය ඉහළ යැමත් මිනිසුන්ගේ අධි පාරිභෝජන රටාවත් , නොසැලකිල්ල හා ආකල්පවල දුර්වලතාත් හේතුවෙන් වාර්ෂිකව නාගරික බල සීමාවේ ජනනය වන කසල ප්‍රමාණය ඉහළ යමින් තිබේ. පසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ දෛනික කසල ජනනය ටොන් 1 - 2 අතර ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර ඉදිරි වර්ෂ 05 ඇතුලත එය ටොන් 05- 10 දක්වා ප්‍රමානයකින් වැඩිවීමේ අවධානමක් ඇත. මෙසේ ජනනය වන කසල වලින් 40% පමණ ප්‍රමාණයක් දිරන කසල වන අතර, ඉතිරි 60% ප්‍රමාණය නොදිරන කසල වේ. දිරන කසල යොදා ගනිමින් කොම්පෝස්ට් අංගනය තුළ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන අතර ඉතිරි 60% ප්‍රමාණයෙන් 10%- 20% අතර ප්‍රමානයක් ප්‍රතිචක්‍රිකරනය සඳහා යොමු කරනු ලබයි. ඉතිරි 40% කට ආසන්න ප්‍රමානයක් කිසිඳු ප්‍රතිකර්මයකින් තොරව අවසන් බැහැරලීම ලෙස කසල බිමට එක් කරනු ලබයි.

එසේම මොනරාගල ප්‍රාදේශීය සභාව දැනට කසල බැහැර කරන ඉඩම සභාව ආරම්භ කළ අවධියේ සිට කසල බැහැර කළ ඉඩම වන අතර, ඉදිරියේදි කසල ජනනය පිළිබඳ අනාගත අපේක්ෂිත තත්වය සැලකූ විට දැනට අවසන් කසල බැහැර කරනු ලබන ඉඩම තිරසාර ලෙස පරිහරනය කිරිම පිළිබඳ වැඩි අවධානයක් යොමු කල යුතුව ඇත.

ඉදිරියේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව කසල බැහැරලීමට අමතර ඉඩම් ලබාදීමක් සිදු නොකරන බවට දන්වා ඇති මුත් යෝජිත සනීපාරක්ෂක කසල රැඳවුම සකස් කිරිම සඳහා විකල්ප ඉඩමක් ලබා ගැනිම අත්‍ය අවශ්‍ය කාරණයක් ලෙස හඳුනා ගෙන ඇත.

මේ වන විට රට තුළ දැවෙන සහ ජාතික ප්‍රශ්නයක්ව ඇති කසල කළමණාකරණ ගැටළුව එලෙසින්ම මොනරාගල ප්‍රාදේශීය සභාවට ද අඩු වැඩි වශයෙන් බලපා ඇති බව සත්‍යයකි. තව ද වෙනත් පළාත් පාලන ආයතන වලට ඇති සමාජයීය ගැටලුවක් වන මහජන විරෝධතා මොනරාගල ප්‍රාදේශීය සභාව කසල බැහැර කරන ස්ථානයටද තිබීම සුවිශේෂි කාරණයක් වේ.

මැස්සන් බෝවීම, ලෙඩරෝග බෝවීම හා අප්‍රසන්නතාවය යන මූලික කරුණු මුල් කර ගනිමින් මෙම විරෝධතා පැන නැග ඇති අතර විරෝධතා කරුවන්ගේ ප්‍රධාන සටන් පාඨය වූයේ "නගරයේ කුණු අපට එපා" යන පාඨයයි. මිනිසුන් එසේ උද්ඝෝෂණය කළ ද ප්‍රාදේශීය සභාවට කසල බැහැරලීමට වෙනත් විකල්ප ඉඩමක් ද ස්ථිරව මෙතෙක් ලැබී නොමැත.

එසේ නම් කළ යුත්තේ මෙම ගැටළු අවම කර ගනිමින්, කසල බැහැරලන ඉඩම අවට ජනතාවගේ ඉල්ලීම්වලට සාධාරණයක් වන පරිදි පවතින සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගනිමින් කසල කළමණාකරණය විධිමත්ව සිදු කිරිම බව ප්‍රාදේශීය සභාවේ පරිපාලනය හඳුනාගෙන ඇත. වර්ථමාන රජය විසින් ගෙන ඇති තීරනයකට අනුව කාබනික පොහොර යොදා ගනිමින් කෘෂිකාර්මික කටයුතු සිදු කිරිම දිරිගැන්වීමේ වැඩ සටහනට අනුව වර්ථමානයේ රටේ කාබනික පොහොර සඳහා ඇති අධික ඉල්ලුමට සැලකිය යුතු ප්‍රමානයක කාබනික පොහොර සැපයුමක් සිදු කිරිමට හැකියාවක් ඇතිනම් එය පළාත් පලාන ආයතනයේ ආදායම් තත්වය ශක්තිමත් වනවා සේම ඒකා බද්ධ කසල කළ මණාකරන ක්‍රියාවලිය යටතේ දරන කසල වලට වැඩි ආර්ථික වටිනාකමක් ලබා දිය හැකි සේම කසල ගැටලුව සඳහා ජනතාවගේ ඇති විරෝධයට ද සැලකිය යුතු විසඳුමක් ලැබෙනු ඇත.මේ සඳහා මූලිකව පස් අවුරුදු සැලැස්මක් සකස් කිරිමත් එම සැලැස්මට අනුව වාර්ෂිකව ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරිමත් අවශ්‍ය බව හඳුනා ගෙන ඇත. ඒ අනුව 2020වර්ෂයේ සකස් කරන ලද ක්‍රියාත්මක සැලැස්මට සමගාමීව 2021වර්ෂයේ දි ක්‍රියාත්මක කිරිමට සුදුසු ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාත්මක සැලැස්මක් මේ සමග යෝජනා කර ඇති අතර, එය පහත කාරණා මුල්කර ගනිමින් සකස් කර ඇත.

01. ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සම්බන්ධයෙන් ආයතනික මැදිහත් වීම.

02. ඝන අපද්‍රව්‍ය කළමණාකරණ විෂය යටතේ සේවය කරනු ලබන සේවකයින් සඳහා වටිනාකමක් සහ අගයක් ලබාදීම.

03. දැනට සිදු කරන කසල කළමණාකරණ ක්‍රියාවලිය කඩිනම් සහ විධිමත් කිරිම.

04. නගර අලංකරණය හා හරිත පරිසරයක් ගොඩ නැගීම.

05. කොම්පෝස්ට් ව්‍යාපෘතිය සහ අවසන් බැහැරලන ස්ථානය වැඩිදියුණු කිරිම සහ අවට ගම්මානයට අවශ්‍ය පහසුකම් සැපයීම.

06. ඇගයීම් හා පසුවිපරම් කටයුතු සිදු කිරිම.

## <u>දැක්ම</u>

**"අනාගතයට පිරිසිදු සහ හරිතවත් නගරයක්"**

## <u>මෙහෙවර</u>

මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ නාගරික සීමාව තුළ ජනනය වන කසල විධිමත්ව නිසි කළමණාකරණයකින් යුතුව එක්රැස් කිරිම, තේරීම, ප්‍රවාහනය කිරිම, ප්‍රතිචක්‍රිකරණය කිරිම, කොම්පෝස්ට් සකස් කිරිම සහ පරිසර දූෂණය අවම වන පරිදි අවසන් බැහැරලීම සිදු කිරිම තුළින් සභා බල ප්‍රදේශයේ ජනනය වන කසල තිරසාර ලෙස කළමණාකරණය කිරිම මෙහෙවර වේ.

## <u>අරමුණු</u>

01.නිශ්චිත කාලරාමුවකට අනුව නිසි ක්‍රමවේද අනුගමනය කරමින් බල ප්‍රදේශය තුළ ජනනය වන කසල නිසි වේලාවට එක්රැස් කිරිම හා ප්‍රවාහනය කිරිම.

02. බල ප්‍රදේශයේ නාගරික සීමාව තුල ප්‍රධාන මාර්ග දෙපස පිරිසිදුව, ආකර්ශනීයව සහ හරිතවත්ව පවත්වා ගෙන යාම

03.නිසි දැනුවත් කිරිම් මගින් ජනනය වන කසල, දිරන හා නොදිරන ලෙස වර්ග කර බැහැරලීමට ජනතාව දැනුවත් කිරිම හා කසල බැහැර කර ඇති ස්ථානයේදී, බැහැර කර ඇති කසල දිරන නොදිරන ලෙස වෙන් කර ප්‍රවාහනය කිරිම.

04.දිරන කසල යොදා ගනිමින් කොම්පෝස්ට් සකස් කිරිම හා නොදිරන කසල තවදුරටත් වර්ග කර 3R සංකල්පය යටතේ ප්‍රතිචක්‍රිකරණ ක්‍රියාවලියට යොමු කිරිම තුළින් කසලවලට ආර්ථික වටිනාකමක් එක් කිරිම.

05. කසල කළමණාකරනයට සම්බන්ධ ව්‍යාවසායකයින් හදුනා ගැනිම සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් සපයා දීම තුලින් ඔවුන් දිරිමත් කිරිම.

06.ප්‍රතිචක්‍රිකරණය කළ නොහැකි සහ කොම්පෝස්ට් සකස් කිරිමට ගත නොහැකි කසල විධිමත් පරිදි අවසන් බැහැර ලීමට යොමු කිරිම.

07.කසල බැහැරලන ස්ථානය හා අවට ප්‍රදේශය අවම පරිසර හානියක් ඇතිවන පරිදිත්, සෞඛ්‍ය ගැටළු අවම වන පරිදිත් පවත්වා ගෙන යාම සහ කසල බැහර කරන ස්ථානය අවට හරිත තීරු ඇති කිරිම තුළින් ආකර්ශණිය පරිසරයක් පවත්වා ගෙන යාම තුලින් අගයක් එකතු කිරිම.

## පළාත් පාලන ආයතනය පිළිබඳ පොදු තොරතුරු

- පළාත - ඌව
- පරිපාලන දිස්ත්‍රික්කය - මොනරාගල
- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය - මොනරාගල
- මැතිවරණ කොට්ඨාශය - මොනරාගල
- පළාත් පාලන ආයතනයේ නම - මොනරාගල ප්‍රාදේශිය සභාව
- දුරකථන අංකය/ෆැක්ස් අංකය - 055-2276175
- විද්‍යුත් ලිපිනය - mon.prasabawa@gmail.com
- වෙබ් ලිපිනය - www.monaragala.ps.gov.lk
- සේවක සංඛ්‍යාව - ස්ථිර - 115, අනියම් - 23
- බල ප්‍රදේශයේ විශාලත්වය - වර්ග කිලෝමීටර් 255.1
- පළාත් පලාන ඡන්ද කොට්ඨාශ ගණන - 10
- ග්‍රාම සේවා වසම් ගණන - 26

| අනු අංකය | අංකය | ග්‍රාම නිළධාරි වසම |
|---|---|---|
| 01 | 125 | කහම්බාන |
| 02 | 125/ඒ | මාරාව |
| 03 | 125/බී | තෙගල්ලන්ද |
| 04 | 127 | කොලොන්වින්න |
| 05 | 127/ඒ | වෙහෙරගල |
| 06 | 127/බී | බෝහිටිය |
| 07 | 129 | මුප්පනේ |
| 08 | 129/ඒ | කවුඩාව |
| 09 | 129/බී | මොනරාගල |
| 10 | 129/සී | හුලංදාව |
| 11 | 129/ඩී | හිදිකිවුල |
| 12 | 129/ඊ | මාගන්දනමුල්ල |
| 13 | 129/එෆ් | විහාරමුල්ල |
| 14 | 129/ජී | හුලංදාව වම |
| 15 | 129/එච් | හුලංදාව දකුණ |
| 16 | 129/අයි | අලියාවත්ත |
| 17 | 130 | බටුගම්මන |
| 18 | 130/ඒ | නක්කල |
| 19 | 130/බී | වැලියාය |
| 20 | 130/සී | දෙබැද්දේකිවුල |
| 21 | 130/ඩී | රත්තනපිටිය |
| 22 | 130/ඊ | ටැංවත්ත |
| 23 | 130/එෆ් | ගුරුහෙල |
| 24 | 131/ඒ | කුඹුක්කන |
| 25 | 131/බී | මදුරුකැටිය |
| 26 | 132/සී | හොරොම්බුව |

- ❖ ජනගහනය - 58073(2019සංගණනය)
- ❖ පවුල් සංඛ්‍යාව - 15500
- ❖ දෛනිකව ජනනය වන කසල ප්‍රමානය - ටොන් 15 පමන
- ❖ දෛනිකව සභාව විසින් එකතු කරන කසල ප්‍රමානය- ටොන් 10-12පමන
- ❖ දෛනිකව පෞද්ගලික ව්‍යාවසායකයින් ( සත්ව ගොවිපල සඳහා ) විසින් එකතු කරන කසල ප්‍රමානය - ටොන් 05 පමන



## මොනරාගල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියට අදාල දත්ත හා තොරතුරු

කසල එකතු කරන සීමාව - වැල්ලවාය පොතුවිල් මාර්ගයේ වැලියාය සිට හොරොම්බුව හංදිය දක්වා ප්‍රධාන මාර්ගයේ 10km වේ.

- මොනරාගල නගරය, නව පොල භූමිය, තොගපොල භූමිය, නව බස් නැවතුම්පල , කුමාරදොල පාර.

- දුටුගැමුණු පාර, තිස්ස පාර, වැදිකුඹුර පාර, මහානාම කණිෂ්ඨ පාර, රාජකීය විද්‍යාල මාවත, කුමාරපුර, හුලංදාව හංදිය, ඩිපෝව පාර, SOS මාර්ගය, දොඩම්වත්ත, ඩිපෝ හංදිය දක්වා

- බිබිල පාර හරිත උද්‍යානය දක්වා.

- මොනරාගල නගරයේ පිහිටි සියලු රාජ්‍ය හා පෞද්ගලික ආයතන එනම් පොලිසිය, උසාවි සංකීර්ණය, බන්ධනාගාරය, ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඇති සියලු රාජ්‍ය ආයතන, පොලිස් අධිකාරි කාර්යාලය , නිවාස අධිකාරිය , ජල සම්පාදන මණ්ඩලය, කච්චේරි සංකීර්ණය මිනින්දෝරු කාර්යාලය, සමුපකාර කාර්යාලය.

- කුඹුක්කන හංදිය, නක්කල හංදිය.

- ජේ.ජේ.ගාමන්ට් / ලංගම ඩිපෝව

### කසල ජනනය පිළිබඳ තොරතුරු

සභා බල ප්‍රදේශයෙන් කසල එකතු කරන ප්‍රදේශය ප්‍රතිශතයක් ලෙස 23% ක් පමණ (වසම් 06 ක් ආවරණය වන පරිදි)

- දිනකට එකතු කරන කසල ප්‍රමාණය - ටොන් 10 – 12 අතර ප්‍රමාණයේ
  (සතිපොල හා අවුරුදු පොල පැවැත්වෙන දිනවල ටොන් 15 ඉක්මවා යනු ලබයි)
  මාසිකව ටොන් 300 ක් පමණ

- එකතු කරන කසල ප්‍රතිශතය(දෛනිකව)- දිරන කසල 40%
  නොදිරන කසල 60%

- කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කරන කසල ප්‍රමාණය(මාසිකව) - ටොන් 15

- ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන කසල ටොන් ප්‍රමාණය (මාසිකව) - ටොන් 05 ක් පමණ

- සත්ව ගොවිපළවල් සඳහා රැගෙන යන ප්‍රමාණය (මාසිකව) - ටොන් 80 ක් පමණ

- අතුරු නිෂ්පාදන සකස් කිරිම සඳහා මහජනතාව ගෙන යන ප්‍රමාණය(රෙදි කැබලි) (මාසිකව) - ටොන් 01 ක් පමණ.
- අවසන් බැහැරලීම සඳහා යොමු කරන කසල ප්‍රමාණය (මාසිකව) - ටොන් 100 ක් පමණ.
- එක් රැස් කිරිමට ඉතිරිවන කසල ප්‍රමානය මාසිකව ටොන් 25 – 50 අතර (මෙම කසල අතරට ගොඩනැගිලි කඩා ඉවත් කිරිමෙන් ඉවත් කරන ද්‍රව්‍ය ගස් කපා ඉවත් කරන ද්‍රව්‍ය හා ඇල මාර්ග හා කාණු පද්ධති වල එකතු වන අපද්‍රව්‍ය වේ)

<u>කසල එකතු කිරීමට ඇති මානව හා භෞතික සම්පත් ප්‍රමානය</u>

| | | | |
|---|---|---|---|
| 1. | සුළු වැඩ පරිපාලක | - | ස්ථිර 01 / වැඩ බලන 01 |
| 2. | රියදුරු | - | 05 |
| 3. | කම්කරු | - | ස්ථිර 20 අනියම් 10 |
| 4. | රථවාහන | - | රෝද හතර ට්‍රැක්ටර් 05 |
| | | | අත් කරත්ත 04 |

**<u>මොනරාගල ප්‍රාදේශීය සභාව කසල එකතු කරන ක්‍රමවේදය</u>**

ප්‍රධාන කලාප 04ක් වශයෙන් දිවා සහ රාත්‍රි ලෙස සේවා මුර දෙකක් යටතේ කසල එකතු කිරීම සිදු කරනු ලබයි

**01. කලාපය:- මොනරාගල නගරය**

**කසල එකතු කරන වෙලාව - දිනපතා ප.ව 6.00 සිට පෙ.ව 2.00 දක්වා**

පොතුවිල් පාර සිනමා ශාලාව අසල සිට ඔරලෝසු කණුව දක්වා, කුමාරදොල පාර රබර් කර්මාන්ත ශාලාව දක්වා, දින පොල භූමිය, පොදු වෙළඳපල, නව බස් නැවතුම්පල හා බස් නැවතුම් පල පිවිසුම් මාර්ගය, ඔරලෝසු කණුව සිට වැල්ලවාය මාර්ගයේ තැපැල් කන්තෝරුව දක්වා කොටස.

| | | |
|---|---|---|
| යොදවා ඇති ට්‍රැක්ටර් ගණන | - | 01 |
| රියදුරු | - | 01 |
| කම්කරු කසල පැටවීමට | - | 06 |
| වීථි ඇමදීමට | - | 01 |
| අත් කරත්ත | - | 03 |

දැනට කසල එකතු කරන ආකාරය - දිරන කසල වලින් ආපන ශාලා සහ වලින් ඉවතලන ආහාර අපද්‍රව්‍ය සත්ව ගොවිපල් කරුවන් විසින් එකතු කරනු ලබයි. නොදිරන කසල වලින් ප්‍රතිචක්‍රිකරනය කල හැකි කසල සුලු ප්‍රමානයක් වෙනම එකතු කරනු ලබන අතර ඉතිරි කසල මිශ්‍රව එකතු කර අවසන් බැහැරලීමට යොමු කරනු ලබයි.

දිනකට එකතු කරන ප්‍රමාණය - ටේලර් 01

**02.** කලාපය:- පොතුවිල් පාර

**කසල එකතු කරන වෙලාව - දිනපතා පෙ.ව 7.00 සිට ප.ව 2.30 දක්වා**

ප්‍රාදේශීය සභා කාර්යාලය අසල සිට වැලියාය පිරිවෙණ දක්වා සහ එම ප්‍රදේශයේ අතුරු මාර්ග.
යොදවා ඇති ට්‍රැක්ටර් ගණන - 01

රියදුරු - 01

කම්කරු කසල තෝරා පැටවීමට - 03

වීථිය ඇමදීමට කම්කරු - 01

| දිනය | වෙලාව | ප්‍රදේශය | කසල එකතු කරන ආකාරය |
|---|---|---|---|
| දිනපතා | පෙ.ව 7.00 සිට ප.ව 2.00 දක්වා | ප්‍රාදේශීය සභා කාර්යාලය අසල සිට සිරිගල දක්වා ප්‍රධාන මාර්ගය, එම මාර්ගයේ ඇති සියලු පෞද්ගලික ආයතන සහ රාජ්‍ය ආයතන. | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි. |
| සිකුරාදා | පෙ.ව 7.00 සිට ප.ව 2.00 දක්වා | ප්‍රාදේශීය සභා කාර්යාලය අසල සිට බටුගම්මන හංදිය දක්වා ප්‍රධාන මාර්ගය සහ වැලියාය පිරිවෙන. | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි |
| සෙනසුරාදා | ප.ව.2.00 සිට | තොග පොල සහ සති පොල | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි |

දැනට කසල එකතු කරන ආකාරය - දිරන/ නොදිරන ලෙස තෝරා එකතු කරනු ලබයි.
දිනකට එකතු කරන කසල ප්‍රමාණය - ටේලර් රථ 01

**03.** කලාපය: - වැල්ලවාය පාර

ප්‍රාදේශීය සභා කාර්යාලය අසල සිට හොරොම්බුව හන්දිය දක්වා, ඩිපෝ පාර, SOS පාර ඩිපෝ හන්දිය, උසාවිය සංකීර්ණය, ප්‍රාදේශීය සභා කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකිර්ණය, විදුලි බල මණ්ඩලය , ජල සම්පාදන මණ්ඩලය එම කලාපයේ සියලු පෞද්ගලික ආයතන, නිවාස අධිකාරි පාර.

**කසල එකතු කරන වෙලාව - දිනපතා පෙ.ව 7.0 සිට ප.ව 2.00 දක්වා**

| දිනය | වෙලාව | ප්‍රදේශය | කසල එකතු කරන ආකාරය |
|---|---|---|---|
| දිනපතා | පෙ.ව 7.00 සිට ප.ව 2.00 දක්වා | ප්‍රාදේශීය සභා කාර්යාලය අසල සිට හොරොම්බුව හංදිය දක්වා ප්‍රධාන මාර්ගය දෙපස, ඩිපෝ පාර, SOS පාර, ඩිපෝ හන්දිය, උසාවි සංකීර්ණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංකීර්ණය, විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, නිවාස අධිකාරිය, පොලිස් අධිකාරි කාර්යාලය | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි. |

යොදවා ඇති ට්‍රැක්ටර් ගණන - 01

රියදුරු - 01

කම්කරු කසල පැටවීමට - 03

වීථිය ඇමදීමට - 01

දැනට කසල එකතු කරන ආකාරය - දිරන /නොදිරන ලෙස තෝරා එකතු කරනු ලබයි.

දිනකට එකතු කරන කසල ප්‍රමාණය - ටේලර් රථ 01

**04. කලාපය:-අතුරු මාර්ග හා උප නගර**

වැදිකුඹුර පාර, තිස්ස පාර, දුටුගැමුණු පාර, ප්‍රධාන පාසල් 03, මහානාම කණිටු විදුහල් මාර්ගය, රාජකීය පාර, මහ මෙව්නා අසපුව, කුමාරපුර, බිබිල පාර, කුඹුක්කන හංදිය, නක්කල හංදිය, ජේ ජේ ගාමන්ට්, මියාමි ඇපරල් සති පොල සහ තොග පොල.

යොදවා ඇති ට්‍රැක්ටර් ගණන - 01

රියදුරු - 01

කම්කරු - 04

| දිනය | වෙලාව | ප්‍රදේශය | කසල එකතු කරන ආකාරය |
|---|---|---|---|
| බදාදා සහ සෙනසුරාදා | පෙ.ව.7.00 සිට ප.ව.2.00 දක්වා | තිස්ස පාර/දුටුගැමුණු පාර/වෙලේවත්ත පාර | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි. |
| සිකුරාදා | පෙ.ව.7.00 සිට ප.ව.2.00 දක්වා | කුඹුක්කන/නක්කල | නොදිරන කසල පමනක් වෙන් කර එකතු කරනු ලබයි. |
| ඉරිදා | ප.ව.5.00 සිට පෙ.ව.2.00 දක්වා | මහානාම කනිටු විදුහල මාර්ගය, රාජකිය විදුහල මාර්ගය බිබිල පාර දක්වා , බිබිල පාර සිට හුලංදාව හන්දිය දක්වා , කුමාරපුර | නොදිරන කසල පමනක් වෙන් කර එකතු කරනු ලබයි. |
| සඳුදා | පෙ.ව. 6.00 සිට ප.ව 1.00 දක්වා | සති පොල | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු ලබයි. |
| අගහරුවාදා | පෙ.ව.7.00 සිට ප.ව.2.00 දක්වා | ජේ.ජේගාමන්ට් / මදුරුකැටිය ගාමන්ට් ලංගම ඩිපෝව සහ වෙනත් තොග කසල ඇති ස්ථාන (දන්වන අවස්ථාවල) | දිරන සහ නොදිරන ලෙස වෙන් කර එකතු කරනු නොලබයි. |

දිනකට එකතු කරන කසල ප්‍රමාණය - ටේලර් 01 / ටිපර් රථ 01

<u>මොනරාගල ප්‍රාදේශීය සභාව කසල එකතු කරන සීමාව</u>




<u>ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය සහ අවසන් බැහැරලන ස්ථානයට අදාළ තොරතුරු</u>

පිහිටි ස්ථානය:- මොනරාගල නගරයේ සිට කිලෝමීටර් 08 ක් වැල්ලවාය දෙසට හොරොම්බුව සුදුවතුර ආර මාර්ගයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් දරගොඩ ස්ථානය

ප්‍රමාණය :- අක්කර 4 ½

ඉඩමේ අයිතිය :- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන අතර, විවිධ අවසර පත්‍ර යටතේ වාර්ෂිකව බලපත්‍රය අළුත් කිරීමේ පදනම මත ප්‍රාදේශීය සභාවට ලබාදී ඇත.




<u>**මොනරාගල ප්‍රාදේශිය සභාවේ කසල කළමණාකරන මධ්‍යස්ථානය පිහිටි ස්ථානය**</u>

<u>**කොම්පොස්ට් ව්‍යාපෘතිය**</u>

කොම්පෝස්ට් ව්‍යාපෘතිය ඉදිකිරිම සඳහා ප්‍රතිපාදන ලබාදීම - 2011 දැයට කිරුල සංවර්ධන වැඩසටහනට සමගාමීව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය කළමණාකරණ සහායක මධ්‍යස්ථානය මගින් රු.10,569,222.33 ක මුදලක් ලබාදී ඇති අතර, ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරිම් කටයුතු සිදු කරන ලදී.

<u>**කොම්පොස්ට් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය**</u>

| | |
|---|---|
| මධ්‍යස්ථාන භාරකරු (යෝජිත) | - 01 |
| කම්කරු | - ස්ථිර 02 අනියම් / දෛනික 03 |

**<u>කොම්පොස්ට් ව්‍යාපෘතියේ ඇති සම්පත්</u>**

| අනු අංකය | වර්ගය | ප්‍රමානය |
|---|---|---|
| 01 | කොම්පෝස්ට් අංගන | 02 |
| 02 | සේවක නේවාසිකාගාර | 01 |
| 03 | ජල ටැංකි සහිත ජල සැපයුම් පද්ධති | 01 |
| 04 | හලර් යන්ත්‍ර | 01 |
| 05 | ආදර්ශ ගෙවත්ත / උද්‍යානය | 01 |
| 06 | විවෘත / එළිමහන් කොම්පෝස්ට් පැඩ් | 01 |
| 07 | ප්‍රතිචක්‍රිකරනය කලහැකි කසල ගබඩා | 01 |
| 08 | පොහොර ගබඩා | 01 |
| 09 | අත් කරත්ත | 01 |
| 10 | කටර් යන්ත්‍ර | 01 |

**<u>බල ප්‍රදේශයේ බහුලව කසල ජනනය වන ස්ථාන/කසල එක් රැස්කරන ප්‍රභවයන් සහ ප්‍රමානයන්</u>**

| **අනු අංකය** | **ස්ථානය** | **ප්‍රමාණය (දිනකට / සතියකට)** |
|---|---|---|
| 01 | සිරිගල සිට මොනරාගල නගරය දක්වා ප්‍රධාන මාර්ගය | ටොන් 04 |
| 02 | මොනරාගල නගරයේ සිට හොරොම්බුව හංදිය දක්වා ප්‍රධාන මාර්ගය(රජයේ කාර්යාල ද ඇතුළුව) | ටොන් 04 |
| 03 | නගරය | ටොන් 04 – 05 ත් අතර |
| 04 | කුඹුක්කන, නක්කල උප නගර සහ මහමෙච්නාව, ඇඟළුම් කම්හල | සතියකට ටොන් 04 |

****ඉහත ප්‍රමාණයන් කළින් කළට වෙනස් වේ.**

## කසල ජනනයවන ප්‍රභවයන් හා ප්‍රමාණයන්

| අනු අංකය | ප්‍රභවය | ප්‍රමාණය(දෛනිකව) |
|---|---|---|
| 01 | වීදි ඇමදීමෙන් | ටොන් 01 පමන |
| 02 | නිවාසවලින් | ටොන් 02 පමන |
| 03 | ව්‍යාපාරික ස්ථාන | ටොන් 01 පමන |
| 04 | දින පොළ, සතිපොළ | ටොන් 03 පමන |
| 05 | ආගන්තුක නිවාස හා හෝටල් | ටොන් 04 පමන |
| 06 | වෙනත් | ටොන් 03පමන |

****ඉහත ප්‍රමාණයන් ද කළින් කළට වෙනස් වේ.**

# ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල සංවිධාන සටහන



## මොනරාගල ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශය සඳහා අනුමත කාර්යය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය | සේවය | පන්තිය/ශ්‍රේණිය | වැටුප් කේතය | බඳවා ගනු ලබන පදනම(ස්ථිර/කොන්ත්‍රාත්/ආදේශ/අනියම්) | වැඩ අධ්‍යනය අනුව අවශ්‍ය වන කාර්යය මණ්ඩලය **(2017.09.30)** | |
|---|---|---|---|---|---|---|---|
| 02 | සෞඛ්‍ය පරිපාලක | DEPT | 111/11/1 | PL2/-03/2016 | ස්ථිර | 01 | |
| 03 | රියදුරු | DEPT | 111/11/1 | PL3/-03/2016 | ස්ථිර | 05 | |
| 10 | සෞඛ්‍ය කම්කරු | DEPT | 111/11/1 | PL1/-03/2016 | ස්ථිර | 23 | |

**මොණරාගල ප්‍රාදේශිය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා පිහිටුවන ලද කමිටුව**

| කමිටු තනතුර | නියෝජනය |
|---|---|
| කමිටු සභාපති | ගරු සභාපතිතුමා |
| සම සභාපති | සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි, |
| විශේෂ සාමාජික | ප්‍රාදේශිය සභාවේ පරිසර හා සෞඛ්‍ය කමිටුවේ සාමාජික මන්ත්‍රිවරු |
| ලේකම් | ප්‍රාදේශිය සභාවේ පරිසර විෂය භාර නිළධාරි |
| සාමාජික | කාර්මික නිළධාරි |
| සාමාජික | ප්‍රජා සංවර්ධන නිළධාරි , පළාත් පලාන සහකාර කොමසාරිස් කාර්යාලය. |
| සාමාජික | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| සාමාජික | ප්‍රාදේශිය පරිසර නිළධාරි |
| සාමාජික | වෙළඳසංගමයේ ලේකම්/සභාපති හෝ නියෝජිතයෙකු |
| සාමාජික | පොදු වෙළඳ සංගමයේ ලේකම්/සභාපති හෝ නියෝජිතයෙකු |
| සාමාජික | ඩී.එම්.කරුණාරත්න මයා, දුටුගැමුණු පාර පදිංචිකරුවෙකු |
| සාමාජික | සංජීව බංඩාර මයා, නියෝජිත, සොබා පදනම, |

**ඝණ අපද්‍රව්‍ය කලමනාකරණ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ඇති වෙනත් ක්‍රියා මාර්ග**

01. නොදිරන/ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල මිලදී ගැනීම සඳහා කසල සම්පත් මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබීම.

02. දිරන කසල කොම්පොස්ට් කරණය සඳහා කොම්පොස්ට් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම.

03. අවසන් කසල බැහැරලීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අක්කර 4 ½ ඉඩම් කොටසක් හොරොම්බුව සුදුවතුරආර දරගොඩ ස්ථානයෙන් ලබා ගෙන තිබීම.

04. දැනට එම ඉඩම් කොටසේ කොම්පොස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, අවසන් බැහැරලීම හා ප්‍රතිචක්‍රීකරනය කල හැකි කසල ගබඩා කර තැබීම සිදු කරනු ලබයි.

05. ගලි පිරිපහදු පද්ධතියක් සකස් කිරීම (යෝජිත)

06. ජීව වායු ඒකකයක් ස්ථාපිත කිරීම (යෝජිත)

07. සනීපාරක්ෂක බිම් පිරවුමක් ඉදිකිරීම (යෝජිත)

08. සායනික අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා පුද්ගලික ආයතනයක සහාය ලබා ගැනිම.

09. කසල අවසන් බැහැරලීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරිමට අක්කර 02 ඉඩම් ප්‍රමානයක් ලබා ගැනිමට යෝජනා කර තිබිම.

10. අඩි 80x45 ප්‍රමානයේ කසල අංගනයක් සහ අඩි 40x25 ප්‍රමානයේ කසල තේරිමේ ශාලාවක් සකස් කිරිමට යෝජනා කර තිබීම.

## ක්‍රියාකාරි සැලැස්ම

මොනරාගල ප්‍රාදේශීය සභාව කසල කළමණාකරණය සඳහා 2018- 2022 කාල සීමාව තුළ ලගා කර ගත යුතු ඉලක්ක සහ අරමුණු පහතින් දක්වා ඇති අතර, එම අරමුණු හා ඉලක්කවලට අදාළව 2018 වර්ෂයේදී සිදු කිරිම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් සහිත ක්‍රියාකාරි සැලැස්ම පහත පරිදි වේ.

### පස් අවුරුදු ඝණ අපද්‍රව්‍ය ක්‍රියාත්මකසැලැස්මට අදාළව හඳුනාගත් අරමුණු හා ඉලක්ක

| අනු අංක | අරමුණු | ඉලක්ක | කාලසීමාව |
|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරුවන්ගේ සහ කසල එකතු කරන්නන්ගේ භාහිර ස්වරූපය හා රාජකාරි රටාව වෙනස් කිරීම | කම්කරුවන් සඳහා වටිනාකමක් ලබාදීම | 2019 -2024 |
| 02 | කසල කළමණාකරණය සඳහා දැනට සිදුකරගෙන යන ක්‍රමවේදය විධිමත් කිරීම | කසල කළමණාකරණය සඳහා දැනට සිදු කරගෙන යනු ලබන ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම | 2019 -2024 |
| 03 | ආයතන මට්ටමින් රාජකාරි සහ වගකීම් පැවරීම | ආයතනික මැදිහත්වීම ක්‍රමානුකූල කිරීම | 2019 -2024 |
| 04 | මහජන සහයෝගය ලබා ගැනිම සඳහා ජාලගත ක්‍රමවේදයක් සකස් කිරීම | මහජන දායකත්වය ලබා ගැනීම | 2019 -2024 |
| 05 | දැනුවත් කිරීම් හා ප්‍රචාරණය | පාර්ශවකරුවන් දැනුවත් කිරීම | 2019 -2024 |
| 06 | කොම්පෝස්ට් අංගනය සහ කසල බැහැරලන ස්ථානය පරිසර හිතකාමී ලෙස වැඩිදියුණු කිරීම | සමාජීය බලපෑම් අවම කිරීම කාබනික පොහොර ප්‍රචලිත කිරීම හා වටිනාකමක් එක් කිරීම | 2019 -2024 |
| 07 | නාගරික සීමාවේ ශාක ගහනය වැඩි කිරීම | නිරෝගී සහ පරිසර හිතකාමී නාගරික පරිසරයක් ඇති කිරීම | 2019 -2024 |
| 08 | අවසන් කසල බැහැරලන ස්ථානයෙන් නිකුත්වන ලීචේට් පාලනය කිරීම සඳහා යූරියා වාෂ්පීකරණ ක්‍රමවේදයක් සකස් කිරීම | ලීචේට් ගලායාම හා පරිසර දූෂණය අවම කිරීම | 2019 -2024 |
| 09 | අර්ධ සනීපාරක්ෂක හෝ විද්‍යාත්මක බිම් පිරවුමක් සකස් කිරීම | අවසන් බැහැරලීම විධිමත් කිරීම | 2019 -2024 |
| 10 | ගලි පිරිපහදු පද්ධතියක් සකස් කිරීම | අපද්‍රව්‍ය විධිමත් ලෙස කළමණාකරණය කිරීම | 2019 -2024 |
| 11 | නීති හා ප්‍රතිපත්ති සකස් කිරීම | කසල කළමණාකරණ ක්‍රියාවලිය නීත්‍යානුකූල කිරීම | 2019 -2024 |
| 12 | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල එකතු කරන්නන් හා ව්‍යාපාරිකයිනන් සඳහා පහසුකමම් සැපයීම | අවසන් බැහැරලීමට එකතුවන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල ප්‍රමානය අවම කිරීම හා වයාපාරිකයින් දැනනුවත් කිරීම | 2019 -2024 |
| 13 | කසල බැහැරලීම සිදුකරන ස්ථානය අවට සෞඛ්‍ය බලපෑම් ඇගයීමක් සිදු කිරිම(Health Impact Assessment) | අවසන් කසල බැහැරලීමෙන් අවට ප්‍රදේශයේ සිදුවන සෞඛ්‍ය බලපෑම පාලනය කිරීම | 2019 -2024 |

<u>සන අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාත්මක සැලැස්ම - 2022</u>

<u>මොනරාගල ප්‍රාදේශීය සභාව</u>

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | කාලසීමාව |
|---|---|---|---|---|
| 01 | 2022 ඝණ අපද්‍රව්‍ය කළමණාකරන ක්‍රියාත්මක සැලැස්ම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිම | ගරු සභාපතිතුමා සහ ගරු මන්ත්‍රි මණ්ඩලය | විෂයභාර නිළධාරි | 2022 ජනවාරි |
| 02 | 2022 වර්ෂයේ ඝණ අප අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරිම ක්‍රියාත්මක කිරිමේ වැඩ පිළිවෙල සකස් කිරිම හා වගකීම් පැවරිම | ප්‍රාදේශිය සභාවේපරිසර කමිටුව සභා ලේකම් කාර්මික නිලධාරි ප්‍රජා සංවර්ධන නිළධාරි විෂය භාර නිළධාරි සුළු වැඩ පරිපාලක | සභා ලේකම් සංවර්ධන නිළධාරි | 2022 ජනවාරි |

<u>ආයතනික මැදිහත්වීම සඳහා කරනු ලබන ක්‍රියාකාරකම්</u>

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට<br><br>කසල කළමණාකරනයට අදාල රාජකාරි හා වගකීම් පැවරිම | ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය | සභා ලේකම් | - | 2022ජනවාරි |
| 02 | මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම. | ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය | සභා ලේකම් | - | සෑම මසකම අවසන් සිකුරාදා |
| 03 | කසල කළමණාකරණ ක්‍රියාවලියට සම්බන්ධ නිළධාරින් හා කාර්ය මණ්ඩලය අධීක්ෂණයට හා පසු විපරම් සඳහා කමිටුවක් පත් කිරීම | කසල කළමණාකරණයට අදාළ කාර්ය මණ්ඩලය | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය | - | 2022 ජනවාරි |
| 04 | මධ්‍යම රජයෙන් හා පළාත් සභාවෙන් සහ වෙනත් මුදල් ප්‍රභවයන්ගෙන් කසල කළමණාකරණය අදාළව ප්‍රතිපාදන සපයා ගැනිමට අවශ්‍ය කටයුතු කිරීම. (ඉදිරි වර්ෂය සඳහා) | සභා ලේකම් ගිණුම් අංශය | සභා ලේකම් සැලසුම් අංශය | - | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |

**<u>කාල රාමුව</u>**

| ක්‍රියා කාරකම අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |

**<u>සේවකයින් සඳහා වටිනාකමක් ලබාදීමේ වැඩසටහන්</u>**

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | කම්කරුවන් සඳහා නිල ඇඳුම් කට්ටලයක් / කබායක් ලබාදීම. | සේවක මණ්ඩලය | සභා ලේකම් මූල්‍ය අංශය | 150000.00 | ජනවාරි සහ මැයි |
| 02 | කම්කරුවන් සඳහා සෞඛ්‍ය සායනයක් පැවැත්වීම | සේවක මණ්ඩලය | සභා ලේකම් මූල්‍ය අංශය | 50,000.00 | මාර්තු |
| 03 | විශේෂිත ඇගයීම් වැඩසටහන් හා සුභසාධන වැඩසටහනක් සංවිධානය කිරීම | සේවක මණ්ඩලය | සභා ලේකම් මූල්‍ය අංශය සුභ සාධන අංශය | 30000.00 | දෙසැම්බර් |
| 04 | මොනරාගල ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරන ක්‍රියාවලිය පරික්ෂා කිරිම සහ අධ්‍යනය කිරිම සඳහා වෙනත් පළාත් පලාන ආයතන වලින් කාර්ය මණ්ඩල ගෙන්වා ගැනිම | සේවක මණ්ඩලය | පළාත් පාලන දෙපාර්ථමේන්තුව | | වසරේ ඕනෑම කාලයක |
| 05 | ආයතනය මට්ටමින් කසල කළමණාකරන තරඟයක් පැවැත්වීම එහිදි හොදම කම්කරුවා , හොදම රියදුරු සහ හොදම කලාපය තේරිම | සේවක මණ්ඩලය | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 25000.00 | දෙසැම්බර් |

කාල රාමුව

| ක්‍රියා කාරකම අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | |

<u>දැනට සිදු කරන කසල කළමණාකරණ ක්‍රියාවලිය කඩිනම් කිරීම / වඩා විධිමත් කිරීමට අදාළ ක්‍රියාකාරකම්</u>

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | අත්‍ය අවශ්‍ය ස්ථාන වල පොදු කසල බඳුන් තැබීම. | නාගරික ප්‍රජාව | කාර්මික නිලධාරි හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය | 100,000.00 | 2022ජනවාරි |
| 02 | විද්‍යුත් අපද්‍රව්‍ය ගබඩා කිරිමට කුටියක් සකස් කිරිම | ප්‍රජාව | කාර්මික නිලධාරි | 500,000.00 | 2022 වර්ෂය තුල |
| 03 | ඉවතලන ජංගම දුරකථන කොටස් එකතු කිරිමට ස්ථාන 02 සකස් කිරිම | දුරකතන අලෙවිකරුවන් සහ අලුත් වැඩියා කරුවන් | කාර්මික නිලධාරි හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය | 20,000.00 | 2022 වර්ෂය තුල |
| 04 | අත්‍යාවශ්‍ය ස්ථානවල ඇති පොදු කසල බැහැරලන ස්ථාන ආකර්ශණීය ලෙස සකස් කිරිම<br><br>1.දිරන නොදිරන ලෙස වර්ණ 02කින් යුතු බඳුන් කට්ටල තැබීම<br>කොළ - දිරන<br>නිල් - නොදිරන<br><br>02. කාර්යාල සඳහා කසල වෙන්කර බැහැර ලීමට කසල බඳුන් ලබා දීම.<br><br>03.දැනුවත් කිරිමේ පුවරු හා ප්‍රචාරක දැන්වීම් සවි කිරීම | නාගරික ප්‍රජාව<br><br>නාගරික ජනතාව<br><br>කාර්යාල ප්‍රජාව<br><br>නාගරික ජනතාව | කාර්මික නිලධාරි හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය<br><br>කාර්මික නිලධාරි හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය<br><br>කාර්මික නිලධාරි හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය<br><br>කාර්මික නිලධාරි | 50000.00<br><br>80000.00<br><br>100,000.00<br><br>300,000.00 | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා<br><br>ජනවාරි සිට දෙසැම්බර් දක්වා<br><br>2022 වර්ෂය තුල |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | කසල ජනනය වන ස්ථානයේදීම කසල දිරන / නොදිරන ලෙස වෙන් කිරීම පිළිබඳ දැනුවත් කිරිම | නිවාස කාර්යාල පාසල් | සංවර්ධන නිළධාරි සුලු වැඩ පරිපාලක | - | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 06 | කසල එක්රැස් කරන ස්ථානයේදීම කසල වෙන් කිරීම | ප්‍රාදේශිය සභාවේ සේවක මණ්ඩලය | සුළුවැඩ පරිපාලක | - | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 07 | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල ව්‍යවසායකයින් හඳුනා ගැනිම , බල ගැන්වීම හා පහසුකම් සපයාදීම | ප්‍රතිචක්‍රිකරණය කල හැකි කසල එකතු කරන්නන් | පාලන අංශය සන අපද්‍රව්‍ය කළමණාකරණ කාර්ය මණ්ඩලය | - | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 08 | විජී ඇමදීම සඳහා ප්‍රමුඛතාවයක් දීම ඒ සඳහා වෙනම සේවක මණ්ඩලයක් යෙදවීම | වෙළඳ සංගමය ප්‍රජාව | සුළුවැඩ පරිපාලක | - | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 09 | නගර සීමාව සඳහා ගැලපෙන ශාක වර්ග වගා කිරීම | ප්‍රජාව | සංවර්ධන නිළධාරි සුළුවැඩ පරිපාලක වැඩ පරිපාලක | 50000.00 | ජනවාරි සැප්තැම්බර් දෙසැම්බර් |
| 10 | අනවසර කටවුට් / පොස්ටර් / බැනර් ඉවත් කිරිම සහ හඳුනාගත් ස්ථාන වල දැන්වීම් පුවරු සවිකිරිම | ව්‍යාපාරික සහ උපකාරන්ක පංති | ආදායම් පරික්ෂක කාර්මික නිලධාරි සුලු වැඩ පරිපාලක | | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 11 | කසළ කළමණාකරන ක්‍රියාවලිය සඳහා ජංගම යෙදවුමක් හඳුන්වා දීම | ප්‍රජාව හා පළාත් පාලන ආයතනයේ නිලධාරින් | සංවර්ධන නිළධාරි තොරතුරු තාක්ෂන අංශය | 600,000.00 | 2022 ජනවාරි පෙබරවාරි |

**කාල රාමුව**

| ක්‍රියා කාරකම් අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | |
| 06 | | | | | | | | | | | | |
| 07 | | | | | | | | | | | | |
| 08 | | | | | | | | | | | | |
| 09 | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | |
| 11 | | | | | | | | | | | | |

මෙම කාල සීමාවන් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව වෙනස් විය හැක.

**කොම්පෝස්ට් ව්‍යාපෘතිය , අවසන් බැහැරලන ස්ථානය වැඩිදියුණු කිරීම**

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | කොම්පෝස්ට් ව්‍යාපෘතිය හා අවසන් කසල බැහැරලන ස්ථානය තුළ ශාක ගහනය වැඩිකිරීම | මහජනතාව ප්‍රජාව | ප්‍රාදේශිය සභා කාර්ය මණ්ඩලය | | ජනවාරි මාර්තු සැප්තැම්බර් දෙසැම්බර් |
| 02 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති උද්‍යානය වැඩිදියුණු කිරීම | මහජනතාව | කොම්පෝස්ට් ව්‍යාපෘතිය කාර්ය මණ්ඩලය | 25000.00 | ජනවාරි මාර්තු සැප්තැම්බර් දෙසැම්බර් |
| 03 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ විදුලි පද්ධතිය අලුත් වැඩියා කිරිම | කොම්පොස්ට් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය | කාර්මික නිළධාරි | 100,000.00 | 2022 ජනවාරි |
| 04 | කොම්පොස්ට් ව්‍යාපෘතිය සඳහා සූර්ය බල විදි පහන් 04 සවිකිරිම | කොම්පොස්ට් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය | කාර්මික නිළධාරි | 800,000.00 | 2022 මාර්තු |
| 05 | විවෘතව බැහැර කර ඇති කසල ඩෝසර් යන්ත්‍ර යොදා ගොඩ ගැසිම හා වල දැමීම | ඝන අපද්‍රව්‍ය කාර්ය මණ්ඩලය | කාර්මික නිලධාරි | 1000,000.00 | වසරට තුන් වරක් |
| 06 | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල ගබඩා කිරීම සඳහා අඩි 40X25 ප්‍රමානයේ ශාලාවක් සකස් කිරිම | ඝන අපද්‍රව්‍ය කාර්ය මණ්ඩලය | කාර්මික නිළධාරි | 500000.00 | 2022 වසර තුළ |
| 07 | අඩි 80 X45 ප්‍රමානයේ කසල අංගනයක් අලුතින් ඉදිකිරිම | ප්‍රාදේශිය සභාව | මහ සභාව | භාහිර ව්‍යාපෘති | 2022 වර්ෂය තුල |
| 07 | කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන ඇති පරිසර ආරක්ෂණ බලපත්‍රයට අදාලව ක්ශේත්‍ර පරික්ෂනයක් සිදු කිරිම | මධ්‍යම පරිසර අධිකාරිය | විෂය භාර නිළධාරි | 20000.00 | 2022 වර්ෂය තුල |
| 08 | කසල සහ ගලි බැහැරලන ස්ථානය සහ ඒ අවට මැස්සන් පාලනය සඳහා මැසිනාශක ඉසිම | ඝන අපද්‍රව්‍ය කාර්ය මණ්ඩලය | විෂය භාර නිළධාරි මධ්‍යස්ථාන භාරකරු | 200,000.00 | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 09 | කසල බැහැරලන අවට නිවෙස් වලට මැසි නාශක ලබා දීම | අවට පදිංචිකරුවන් | විෂය භාර නිළධාරි මධ්‍යස්ථාන භාරකරු | 50,000.00 | ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 10 | සේවක නේවාසිකාගාරය අලුත් වැඩියා කිරිම | කාර්ය මණ්ඩලය | කාර්මික නිළධාරි | 100,000.00 | 2022 මාර්තු |

**කාල රාමුව**

| ක්‍රියා කාරකම අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | | |
| 06 | | | | | | | | | | | | |
| 07 | | | | | | | | | | | | |
| 08 | | | | | | | | | | | | |
| 09 | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | |

මෙම කාල සීමාවන් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව වෙනස් විය හැක.

<u>**දැනුවත් කිරීම් හා සජීවිකරණ වැඩසටහන්**</u>

| අනු අංකය | ක්‍රියාකාරකම/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | සන අපද්‍රව්‍ය කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා සජීවිකරණය(වර්ෂයකට වැඩසටහන් 02 ක්) | වැඩ පරිපාලක හා සේවක මණ්ඩලය | ප්‍රජා .සංවර්ධන නිළධාරි සංවර්ධන නිළධාරි සම්පත් දායකයින් | 25000.00 | 2022 ජනවාරි, මැයි |
| 02 | කසල එක්රැස් කරන සීමාවේ ප්‍රජාව, ව්‍යාපාරික ප්‍රජාව, සංචාරකයින් දැනුවත් කිරීමටරැස්වීම්, බැනර්, කටවුට්, පුවරු, පත්‍රිකා, සකස් කිරිම හා ශබ්ද විකාශන යන්ත්‍ර මගින් දැනුවත් කිරිම. | ප්‍රජාව | -එම- | 50000.00 | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 03 | පෙර පාසල් හා පාසල් පාදක කසල කළමණාකරන වැඩ සටහනක් ආරම්භ කිරීම | පෙර පාසල් හා පාසල් දරුවන්, ගුරු මණ්ඩලය, ප්‍රජාව | -එම- | 500,00.00 | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 04 | ප්‍රාදේශිය සභාව කසල එක්රැස්කරන සීමාවේ සමීක්ෂනයක් සිදු කිරිම | ප්‍රාදේශිය සභාව | කාර්ය මණ්ඩලය | 10,000.00 | වසර තුල |

කාල රාමුව

| ක්‍රියා කාරකම අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | | |

මෙම කාල සීමාවන් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව වෙනස් විය හැක.

<u>**ඇගයීම් හා පසු විපරම් කිරීමේ කටයුතු**</u>

| අනු අංකය | ක්‍රියාකාරකම්/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | පාරිසරික විගණන කමිටුවක් පිහිටුවීම මගින් කසල කළමණාකරණ කටයුතු අධික්ෂණය කිරීම | සන අපද්‍රව්‍ය කාර්ය මණ්ඩලය, ප්‍රජාව හා පළාත් පාලන ආයතනය | පරිසර කමිටුව පළාත් පලාන දෙපාර්ථමේන්තුව | | පෙබරවාරි සිට මාස 02කට වරක් |

කාල රාමුව

| ක්‍රියා කාරකම අංක | JAN | FEB | MAR | APR | MAY | JUNE | JULY | AUG | SEP | OCT | NOV | DEC |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | | |

<u>**සභා අරමුදල් හැර වෙනත් ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරිමට යෝජිත ක්‍රියාකාරකම්**</u>

| අනු අංකය | ක්‍රියාකාරකම්/උප ක්‍රියාකාරකම | ඉලක්ක කණ්ඩායම | සහභාගීත්වය හා වගකීම | වියදම | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | සනීපාරක්ෂක බිම් පිරවුමක් ඉදිකිරිම සඳහා මූලික කටයුතු ආරම්භ කිරිම. | ප්‍රාදේශීය සභාව සහ බල ප්‍රදේශයේ සියලු ජනතාව | මධ්‍යම රජයේ ව්‍යාපෘතියක් මගින් | ඇස්තමේන්තු අනුව | 2022වර්ෂය තුල |
| 02 | ජීව වායු ඒකකයක් සකස් කිරිම | ප්‍රාදේශීය සභාව සහ බල ප්‍රදේශයේ සියලු ජනතාව | ඌව පළාත් සභාව පළාත් පාලන දෙපාර්ථමේන්තුව | ඇස්තමේන්තු අනුව | 2022 වර්ෂය තුල |
| 03 | කාබනික පොහොර නිශ්පාදනයට සහ ප්‍රතිචක්‍රිකරන කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර ලබා ගැනිම. | ප්‍රාදේශීය සභාව සහ බල ප්‍රදේශයේ සියලු ජනතාව | පළාත් පාලන දෙපාර්ථමේන්තුව | ඇස්තමේන්තු අනුව | 2022 වර්ෂය තුල |
| 04 | කොම්පොස්ට් ව්‍යාපාතියේ ඇති විවෘත කොන්ක්‍රිට් පෑඩයට 60X30 ප්‍රමානයේ වහලයක් සකස් කිරිම (2 අදියර) | ප්‍රාදේශීය සභාව සහ බල ප්‍රදේශයේ සියලු ජනතාව | පළාත් පාලන දෙපාර්ථමේන්තුව | ඇස්තමේන්තු අනුව | 2022 වර්ෂය තුල |

## 2022 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක

01.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සීමාවේ ප්‍රධාන මාර්ගය දෙපස කසල එක්රැස්වීම පසුගිය වසරට සාපේක්ෂව 60% කින් අවම කිරීම තුලින් නගර සීමාවේ දැකුම්කළු බව ඉහළ නැංවීම.

02.නාගරික සීමාවේ ශාක ගහනය පසුගිය වර්ෂයට සාපේකෂව 40% කින් ඉහල නැංවීම තුලින් හරිතවත් බව ඉහල නැංවීම.

03.ප්‍රතිචක්‍රීකරනය කල හැකි කසල වෙනම තෝරා කසල සම්පත් මධ්‍යස්ථානයට යොමු කිරිම තුලින් අවසන් බැහැරලීමට එකතුවන නොදිරන කසල ප්‍රමානය පසුගිය වර්ෂයට සාපේක්ෂව 40% කින් අවම කිරිම.

04. ප්‍රතිචක්‍රිකරණය කල හැකි කසල අලෙවි කිරිමට කම්කරුවන්ට අවසර ලබා දිම මගින් කම්කරුවන්ගේ දෛනික සුභසාධන කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කිරිම.

05.හදුනාගත් අත්‍ය අවශ්‍ය ස්ථාන වල පමනක් කසල බඳුන් ස්ථානගත කිරිම තුලින් අවිධිමත් පරිදි සිදු කරන කසල බැහැරලීම පසුගිය වර්ෂයට සාපේකෂව 60% කින් අවම කිරිම.

06.කසල බැහැරලීමට බඳුන් තබා ඇති ස්ථාන වඩා ආකර්ෂණීය ලෙස පවත්වා ගෙන යාම තුලින් කසල විධිමත්ව බැහැරලීම පිළිබඳව ජනතාව තුළ ඇති සුභවාදී ආකල්ප දියුණු කිරිම හා ආදර්ශමත් වීම.

07.කසල බැහැර කර ඇති ස්ථානයේදීම තෝරා වෙනම ප්‍රවාහනය කිරිම තුලින් ප්‍රතිචක්‍රිකරණය කළ හැකි කසලවල ගුණාත්මක භාවය වැඩිවීම හා දිරන කසල යොදා ගනිමින් සිදු කරන කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය පසුගිය වසරට සාපේක්ෂව 30% කින් ඉහළ නැංවීම.

08.ප්‍රාදේශිය සභාව විසින් අලෙවි කරනු ලබන කොම්පොස්ට් පොහොර ප්‍රමාණය පසු ගිය වර්ෂයට සාපේක්ෂව 30% පමන ඉහල නැංවීම.

09.කාබනික පොහොර නිශ්පාදන ප්‍රමානය පසුගිය වර්ෂයට සාපේක්ෂව 50% ඉහළ නැංවීම.

10.මෙතෙක් කසල එකතු නොකරන ලද නමුත් අත්‍ය අවශ්‍යයෙන් කසල එකතු කල යුතු ප්‍රදේශ වල කසල එකතු කිරිම ආරම්භ කිරිම.

11.ඉහත සියළු ඉලක්ක තුලින් මොනරාගල ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය පසුගිය වසරට සාපේක්ෂව 30% කින් ඉහළ නැංවීම.

**<u>මොණරාගල ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනේ විකාශනය</u>**

| අනු අංකය | සිදු කල කාර්යය | වර්ෂය |
|---|---|---|
| 01 | මොනරාගල ප්‍රාදේශීය සභාවට ස්ථිර ලෙස කසල බැහැර කිරිමට ඉඩමක් ලබා ගැනිම. (හොරොම්බුව දරගොඩ වනසංරක්ෂන දෙපාර්ථමේන්තුවට අයත් අක්කර 2.5 ක්) | 2007 |
| 02 | නගරයේ කසල එකතු කිරිම විධිමත් කිරිම සඳහා රාත්‍රි සේවා මුරය ආරම්භ කිරිම. | 2008 |
| 03 | කොම්පෝස්ට් ව්‍යාපාතියේ ඉදිකිරිම් ආරම්භ කිරිම. (2011 දැයට කිරුල සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ) | 2011 |
| 04 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඉදිකිරිම් අවසන් කර කොම්පොස්ට් පොහොර නිශ්පාදනය හා අලෙවි කටයුතු ආරම්භ කිරිම. | 2013 |
| 05 | ප්‍රාදේශිය සභාවට කසල බැහැරලීම සඳහා අමතර අක්කර 02 ලබා ගැනිම. | 2013 |
| 06 | විවෘත භූමියේ සකස් කල කොන්ක්‍රිට් පැඩයක් මත කොම්පෝස්ට් පොහොර සකස් කිරිම ආරම්භ කිරිම | 2014 |
| 06 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ජල සැපයුම විධිමත් කිරිම. (සකස් කරන ලද ලිඳේ සිට ව්‍යාපෘතිය දක්වා ජල නල එලිම සහ ජල මෝටරයක් සවිකිරිම) | 2016 - 2017 |
| 07 | කසල එකතු කරන ක්‍රමවේදය විධිමත් කිරිම සඳහා කසල එකතු කරන ප්‍රදේශය කලාප 04 කට වෙන් කර එක් එක් කලාප සඳහා වෙන වෙනම කාර්ය මණ්ඩල සහ ට්‍රැක්ටර් රථ අනුයුක්ත කිරිම සහ දිරන හා නොදිරන ලෙස කසල වෙන්කර එකතු කිරිම ආරම්භ  කිරිම. | 2016 |

| | | |
|---|---|---|
| 08 | ප්‍රාදේශිය සභාවේ කසල කළමණාකරන ක්‍රියාවලිය වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් යටතේ සිදු කිරිම ආරම්භ කිරිම. | 2017 |
| 09 | කසල බැහැර කිරිම විධිමත් කිරිම සඳහා හඳුනාගත් ස්ථාන වල දිරන හා නොදිරන ලෙස කසල බඳුන් ස්ථාන ගත කිරිම. | 2017 |
| 10 | ප්‍රධාන මාර්ග දෙපස අලංකාරව පවත්වා ගෙන යාමේ අරමුණින් විථී ඇමදීම අනිවාර්යය කාර්යයක් බවට පත් කර ඒ සඳහා වෙනම සේවකයින් යෙදවීම. | 2017 |
| 11 | මාර්ග දෙපස පිරිසිදුව හා ආකර්ශනීය ලෙස පවත්වාගෙන යාම සඳහා මාර්ග දෙපස ඇති ඉටිකොල . පත්තර කැබලි, ටොපි කොල ටින්, බෝතල් වැනි දෑ එකතු කිරිම සඳහා අමතර සේවාවක් ආරම්භ කිරිම. | 2017 |
| 12 | ප්‍රතිචක්‍රිකරනය කල හැකි කසල මිළදි ගැනිම සඳහා පුද්ගලික අංශයේ සහාය ඇතිව<br>"අපි පරිසර මිතුරෝ" නමින් කසල මිළදි ගැනිමේ මධ්‍යස්ථානයක් නගරයේ ආරම්භ කිරිම එම මධ්‍යස්ථානය විසින් කසල වර්ග 10 මිළදි ගැනිම. | 2018 |
| 13 | ඩෙංගු රෝගය ව්‍යාප්තිය පාලනය කිරිම අරමුණින් , වසම් මට්ටමින් ජලය රුඳෙන ද්‍රව්‍ය එනම් වීදුරු බෝතල්, ටින්, ප්ලාස්ටික් , පොල්කටු වැනි ද්‍රව්‍ය එකතු කිරිමට ජංගම සේවයක් ආරම්භ කිරිම. | 2018 |
| 14 | ප්‍රතිචක්‍රිකරනය කල හැකි කසල එකතු කරන ප්‍රමානය වැඩි කිරිම සඳහා , එම ද්‍රව්‍ය එකතු කර ලබන ආදායම කම්කරුවන්ගේ සුභ සාධනය සඳහා යොදවා ගැනිමට කම්කරුවන් දිරිමත් කිරිම. | 2018 |
| 15 | කසල කළමනාකරන ක්‍රියාවලියේ නිරත වන කාර්යමණ්ඩලය දිරිමත් කිරිම සඳහා වාර්ෂිකව ඇගයිම් වැඩසටහන් හෝ තරඟ සංවිධානය කිරිම ආරම්භ කිරිම. | 2018 |

| | | |
|---|---|---|
| 16 | වැලියාය, නක්කල, කුඹුක්කන දක්වා කසල එකතු කරන සීමාව පුලුල් කිරිම. | 2018 |
| 17 | විධිමත්ව කසල බැහැරලීම පිළිබඳව ජනතාව දැනුවත් කිරිම සඳහා නගර සීමාව තුල පුවරු සවිකරමින් ප්‍රචාරන වැඩසටහන් ආරම්භ කිරිම. | 2018 |
| 18 | 2019 ජනාධිපතිවරනයට සමගාමීව මැතිවරණ රාජකාරිවලදි එකතු කරන ලද පෙට් ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රිකරන මධ්‍යස්ථානයකට යොමු කරමින් පෙට් ප්ලාස්ටික් එකතු කිරිම ආරම්භ කිරිම. | 2019 |
| 19 | කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනිම. | 2019 |
| 20 | පෙට් ප්ලාස්ටික් බෝතල් එකතු කිරිම දිරිමත් කිරිම සඳහා සොලිඩාරේට් ආයතන විසින් කසල සම්පත් මාස්ථානයට ප්‍රචාරන පුවරුවක් ලබා දිම. | 2020 |
| 21 | පෙට් ප්ලාස්ටික් බෝතල් බැහැර කිරිම සඳහා විශේෂ කුටි සකස් කර නගරයේ ස්ථාන ගත කිරිම. | 2020 |
| 22 | නගරයේ කඩ සාප්පුවලින් සහ ඇඟලුම් කම්හල් වලින් ඉවතලන පොලිතින් වර්ග 10 පමණ වෙනම එකතු කර ප්‍රතිචක්‍රිකරන මධ්‍යස්ථානයකට යොමු කරමින් පොලිතින් අපද්‍රව්‍ය එකතු කිරිම ආරම්භ කිරිම. | 2020 |
| 23 | ප්‍රාදේශිය සභාව සහ පුද්ගලික අංශය එක්ව ආරම්භ කරන ලද කසල මිළදී ගැනිමේ මාස්ථානය මගින් මිළදී ගන්නා කසල වර්ග ප්‍රමානය 15 දක්වා ඉහල නැංවීම හා එම මධ්‍යස්ථානය විසින් එකතු කරන කසල ප්‍රතිචක්‍රිකරන මධ්‍යස්ථාන වලට යොමු කරන වාර ගණන වැඩි කිරිම. | 2020 |
| 24 | අවසන් කසල බැහැරලීම විධිමත්ව සිදු කිරිම සඳහා සනිපාරක්ෂක බිම් පිරවුමක් සකස් කිරිමට ඔබරගල යාය ප්‍රදේශයෙන් අක්කර 05 ක ඉඩමක් හඳුනා ගැනිම. | 2020 |

| | | |
|---|---|---|
| 25 | දැනට කසල බැහැර ලන ඉඩම අසලින් තවත් අක්කර 02 ලබා ගැනිම සඳහා ඉඩම් කොටස හඳුනා ගැනිම. | 2020 |
| 26 | ජල සම්පාදන අමාත්‍යංශය විසින් ඉදිකිරිමට යෝජිත ගලි පිරිපහදු පද්ධතියේ ඉදිකිරිම් කටයුතු ආරම්භ කිරිම. | 2020 |
| 27 | කොම්පොස්ට් ව්‍යාපෘතියේ පොහොර අට්ට් සකස් කිරිම සඳහා 60X30 ප්‍රමානයේ කොන්ක්‍රිට් පැඩයක් සකස් කිරිම<br>(පලාත් පාලන දෙපාර්ථමේන්තුව) | 2021 |
| 28 | ප්‍රතිචක්‍රිකරනය කල හැකි කසල ගබඩා කිරිම සඳහා ගබඩාවක් සකස් කිරිම<br>(පලාත් පාලන දෙපාර්ථමේන්තුව) | 2021 |
| 29 | කොම්පොස්ට් ව්‍යාපෘතියේ පොහොර අට්ට් සකස් කිරිම සඳහා කොන්ක්‍රිට් පැඩයක් සකස් කිරිම<br>(පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය) | 2021 |
| 30 | පොහොර ගබඩා කිරිම සඳහා ගබඩාවක් සකස් කිරිම<br>(පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය) | 2021 |
| 31 | 60X30 ප්‍රමානයේ කොම්පොස්ට් අංගනයක් සකස් කිරිම<br>(ඌව පළාත් සැලසුම් අංශය) | 2021 |
| 31 | කොම්පොස්ට් ව්‍යාපෘතිය සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් ජල සැපයුම ලබා ගැනිම | 2021 |
| 32 | කොම්පෝස්ට් පොහොර කිරිම සඳහා කිලෝ 150 ප්‍රමානයේ ඩිජිටල් තරාදියක් ලබා ගැනිම | 2021 |

කොම්පෝස්ට් පොහොර වාර්ෂික අලෙවිය

| වර්ෂය | ආදායම |
|---|---|
| 2013 | 10,575.00 |
| 2014 | 18,825.00 |
| 2015 | 46,605.00 |
| 2016 | 69,000.00 |
| 2017 | 107,865.00 |
| 2018 | 91,355.00 |
| 2019 | 77,680.00 |
| 2020 | 229,700.00 |
| 2021 | 346,100.00 |

<u>ඝණ අපද්‍රව්‍ය කළමණාකරනයට අදාලව මොණරාගල ප්‍රාදේශීය සභාව ලබා ඇති ජයග්‍රහණ</u>

| අනු අංකය | තරඟය | පැවැත්වූ ආයතනය | පැවැත්වූ වර්ෂය | ලැබූ ජයග්‍රහනය |
|---|---|---|---|---|
| 01 | ඌව පළාත් රාජ්‍ය ආයතන, පාසල් හා රාජ්‍ය නිළ නිවාස ගෙවතු වගා තරඟය | ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 2012 | මොනරාගල ප්‍රාදේශීය සභාවේ කොම්පොස්ට් ව්‍යාපෘතිය රාජ්‍ය ආයතන අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී. |
| 02 | ඝණ අපද්‍රව්‍ය කළමණාකරන තරඟය | ඌව පළාත් පළාත් පාලන දෙපාර්ථමේන්තුව | 2012 | ප්‍රථම ස්ථානය |
| 03 | ඩෙංගු සහ කසළ කළමණාකරය පිළිබඳ විශේෂ වැඩසටහන ඌව පළාත | ප්‍රධාන ලේකම් කාර්යාලය | 2017 | දෙවන ස්ථානය |
| 04 | ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳ කාර්ය සාධන තරඟය | ඌව පළාත් පළාත් පාලන දෙපාර්ථමේන්තුව | 2017 | ප්‍රථම ස්ථානය |
| 05 | ජනාධිපති පරිසර සම්මාන | මධ්‍යම පරිසර අධිකාරිය | 2017 | අයදුම්කරන ලදී. |

| සකස්කලේ | නිර්දේශ කලේ | අනුමත කලේ |
|---|---|---|
| ඩබ්.ජී. ප්‍රදීප් චන්දන රණසිංහ | ඩී.එම්.අනුර දිසානායක | ආර්.එම්.රත්නවීර |
| සංවර්ධන නිලධාරි | සභාලේකම් | සභාපති |
| ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව |
| මොනරාගල | මොනරාගල | මොනරාගල |